# ලෝකවජ්ජ සංකල්පය හා එහි ස්වභාවය

පාතේගම ඤාණිස්සර හිමි

මුල් බුදුසමයෙහි සඳහන් වන වජ්ජ සංකල්පයේ සංවර්ධන අවස්ථා කීපයක් දැකිය හැකි ය. ඇතැම් වැරදි සඳහා අටුවා ග්‍රන්ථවල භාවිත වන ලෝකවජ්ජ යන වචනය මුල් බුදුසමයෙහි දැක්වෙන අදහස වඩාත් සංවර්ධනය වූ අවස්ථාවකි. වරද පිළිබඳව මූලික සංකල්පය කොටස් දෙකකට බෙදිය හැකි වෙයි. පුද්ගලයා අතින් සිදුවන වරද ඒ ඒ දේශය, කාලය, ස්ථානය අනුව විවිධ අරුත් ගනියි. ඒවා නිවැරදි ව හඳුනා ගත හැකි වන්නේ වරද පිළිබඳ ව දක්වා ඇති වර්ගීකරණය අනුව ය.

පුද්ගලයා විසින් කරනු ලබන ඇතැම් ක්‍රියාවක් කාලය අනුව ලොකු වරදක් බවට පත්විය හැකි ය. ඇතැම් අවස්ථාවක එය එසේ නොවේ. නිදසුනක් ලෙස පදිකයකු පාරේ දකුණු පැත්තෙන් ගමන් කිරීම නිවැරදි පිළිගත් සම්මතය වුව ද ඇඳිරි නිතිය පවතින කාලය තුළ එසේ ගමන් කිරීම ද දඬුවම් ලැබිය යුතු වරදකි. හම ක්‍රියාව වරදක් බවට පත්වන්නේ ඇඳිරි නීතිය පවතින කාල සීමාවෙහි දී සුදු කළ හොත් පමණි. වරද වරදක් වශයෙන් අර්ථ කථනය කිරීමෙහි දී කාලයෙහි පවතින බලපෑම මේ අනුව පැහැදිලි ය.

යම් කිසි පුද්ගලයකු අසවල් වේලාවේ දී මරණයට පත් කළ යුතු යයි කෙනෙකු විසින් අණ කරන අවස්ථාවක දී අණ කරනු ලැබූ පුද්ගලයා කියූ වේලාවට ම එම ක්‍රියාව කරනු ලැබුව හොත් දෙදෙනාට ම පව් සිදු වෙයි. එම කාලය ඉක්ම ගිය පසුව

කළහොත් අණ දුන් පුද්ගලයාට වරද සිදුවන්නේ නැත. මෙබඳු අවස්ථා කීපයක් අටුවා ග්‍රන්ථවල විස්තර කරනු ලැබේ. එනම්; වස්තුව, යාවිශේෂය ආදී වශයෙනි.[1] පුද්ගලයා කරනු ලැබූ වරද හෝ අපරාධය නිශ්චිත ව හඳුනා ගත හැකි වන්නේ එම ක්‍රියාවේ සියලු අංශ අධ්‍යයනය කිරීමකින් පසුව ය.

වරද සහිත ක්‍රියාවක් සිදු කළ පමණින් එය වරදක් හෙවත් අපරාධයක් වශයෙන් බුදුසමය සලකන්නේ නැත. එම ක්‍රියාව සිදු වූ ආකාරය හා අවස්ථාව පිලිබඳ ව අවධානයක් දක්වනු ලැබේ. වරදෙහි ස්වභාවය හා චේතනාව ද ක්‍රියාව ක්‍රියාත්මක වූ ආකාරය ද එම ක්‍රියාව වරදක් යැයි වරදකරු විසින් මැනවින් දැන සිටියෙහි ද සමාජයට අපරාධයක් කිරීමේ චේතනාව ඔහු වෙත පැවතියේ ද, එසේ නැතිනම් එම ක්‍රියාව කරනු ලැබුවේ මනා සිහියෙන් තොරව ද, ආත්මාරක්ෂාව පිණිස ද, ආදී වූ විවිධ ස්වභාවයන් වරදක් තීරණය කිරීමේ දී බුදුසමය විමසා බලයි. පුද්ගලයා කරනු ලැබූ වරදින් සමාජයට ප්‍රබල හානියක් සිදු වුව ද එය ම එක ම මිණුම් දණ්ඩ ලෙස ගෙන ඒ දෙස බැලීම බුදුසමයේ සිරිත නො වේ. එයින් බුදුසමයේ පවත්නා ප්‍රජාතාන්ත්‍රික ස්වභාවය වඩාත් තහවුරු වේ.

මේ අනුව පෙනෙන්නේ පුද්ගලයා විසින් සචේතනිකව සැලසුම් සහගතව කරනු ලබන වැරදි ක්‍රියාව ලෝකවජ්ජ වන බව යි. එම වරද වරදක් වශයෙන් වස්තු කාල ආදී ක්‍රමයන්ගෙන් විනිර්මුක්ත වරදක් ලෙස පිළිගනු ලැබේ.

බුදුසමයෙහි දැක්වෙන වරද පඤ්ඤත්ති වජ්ජ සහ ලෝකවජ්ජ යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වා තිබේ. එසේ ම ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය ද සිවිල් නීතිය[2] හා අපරාධ නීතිය[3] යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වා තිබේ.[4]

සිවිල් වරද යනු සිවිල් සමාජය තුළ පුද්ගලයකු විසින් වෙනත් පුද්ගලයෙකුට එරෙහි ව සචේතනිකව කරනු ලබන වරද ය. අපරාධය යනු පුද්ගලයෙකු විසින් සමාජයට එරෙහි ව කරනු ලබන වරද ය. ලෝකවජ්ජ යන වචනයෙන් අදහස් කරන්නේ අපරාධය යි. දැනට පිළිගෙන ඇති නීතියෙහි ක්‍රියාත්මක වන



මෙම අංශ දෙක හා එයට සම්බන්ධ නීතිමය ක්‍රියාදාමයන් අධිකරණය විසින් දණ්ඩ නීති සංග්‍රහයට අනුගතව සිදු කරනු ලැබේ. ''අපරාධ නීතිය සිවිල් නීතියෙන් වෙනස් වී කැපී පෙනෙයි. සිවිල් නීතිය වරද ගැන පොදුවේ විස්තර කරයි. අපරාධ නීතියේ මීට වෙනස් වූ එක්තරා සුවිශේෂත්වයක් ඇත.[5]

''මිනිස් චර්යාවන්හි දක්නට ලැබෙන 1. අපරාධ හා 2. සිවිල් වැරදි, බොහෝ දුරට සමාජයට එරෙහි ක්‍රියාදාමයක් ලෙස දැක්විය හැකි ය. සිවිල් වැරදිවලදී දේපළ ආදී බොහෝ කරුණු සම්බන්ධයෙන් පාඩුවක් නැති කර ගැනීම සඳහා නීතියේ පිහිට පතනු ලැබේ. බොහෝ දුරට සිවිල් වැරදි බලපාන්නේ එයට සම්බන්ධ අයට ය. නමුත් අපරාධ සමස්ත සමාජය කෙරෙහිම බලපානු ලැබේ. අපගාමී චර්යා නෛතික වශයෙන් විග්‍රහ කිරීමේ දී අපරාධ නීතියේ දක්නට ලැබෙන සාමාන්‍ය මූලධර්ම අතරින් සාවද්‍ය ක්‍රියාව හා සාවද්‍ය චේතනාව පිළිබඳ න්‍යාය වැදගත් වේ. නීති විරෝධී ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සාවද්‍ය ක්‍රියාවකි.''[6]

අපරාධය යනු නීති විරෝධී කියාවක් ය යන අදහස පිළිබඳව විවිධ මතවාද තිබේ. බෞද්ධ විශ්වකෝෂයෙහිද එබඳු අදහසක් දැක්වේ. ''අපරාධය යනු අපරාධ නීතිය උල්ලංඝනය කිරීමක් ය යන නීති විද්‍යාත්මක අර්ථ විග්‍රහය මෙහි ලා ප්‍රමාණවත් නොවේ. එහෙත්, අපරාධවල ප්‍රමාණය, ස්වරූපය ආදිය පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා ගැනීමට මෙම අර්ථ විග්‍රහය තරමක් දුරට ප්‍රයෝජනවත් වේ. විශේෂයෙන්ම මේ සඳහා ප්‍රයෝජනවත් වී ඇත්තේ පොලිස් හා අධිකරණ ආයතනවල සංඛ්‍යා ලේඛනයන් ය. නා නා රටවල් අතර අපරාධ තත්ත්වයන් සන්සන්දනය කරන්නේ ඒ අනුව යි. එහෙත් ඒ ඒ රටවල අපරාධ ගවේෂණ තත්ත්වයේ දියුණුව අපරාධ මිම්ම ආදිය වෙනස් වන නිසා මෙය සර්ව සම්පූර්ණ යයි සැලකිය නො හැකි ය. අපරාධ සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් වන්නේ වාර්තාගත අපරාධ පමණක් බැවින් නියම අපරාධ තත්ත්වය එයින් නිවැරදිව හෝ පිළිබිඹු වෙතැයි කිව නොහේ.[7]

මේ අනුව අපරාධය පිළිබඳව සර්ව සම්පූර්ණ නිගමනයකට එළඹීම අපහසු ය. එසේම රටින් රටට ද අපරාධයක් වෙනස් මුහුණුවර ගනු ලබයි. අපරාධ නීතිය සමාජයෙන් සමාජයට, රටින් රටට වෙනස් වෙයි.[8] ඒ ඒ ප්‍රදේශවල හෝ රටවල අපරාධ නීතියෙන් තහනම් කළ ක්‍රියා තවත් ප්‍රදේශවල රටවල හෝ වකවානුවලදී එබඳු තහනමකට ලක් නොවේ.[9] මේ අනුව අපරාධ නීතිය හා එහි ස්වභාවය විශ්වගත කිරීමේ දී පවතින වෙනස හඳුනාගත හැකි ය.

අපරාධය පිළිබඳව විවිධ අර්ථ විග්‍රහ චින්තකයන් විසින් හඳුන්වා දී තිබේ. බෞද්ධ විශ්වකෝෂය දක්වන්නේ අපරාධය යන්නෙහි අරුත නිශ්චිතවම විග්‍රහ කර දැක්විය නොහැකි බව යි. ''අපරාධ යන්නෙහි අර්ථය ඉඳුරාම විග්‍රහ කිරීම සුකර නො වේ. එයින් විච්‍ය වනුයේ සහජයෙන් මනුෂ්‍යයා සමාජයේ පිළිපදිනු ලබන සාධු සම්මත නීති කැඩීමක් ය යනු ඇතැමුන්ගේ මතය යි. එම නීති කැඩීම සමාජයට අහිතකර යැයි සලකන බැවින් ඇතැම් අය සමාජ විරෝධී ක්‍රියා අපරාධ ලෙස හඳුන්වති.[10]

පොදුවේ පිළිගන්නා සාධු සම්මත සමාජයේ යහපත පිණිස සමාජය විසින් ඇතිකරගනු ලැබූ ඒවා ය. එම සම්මතයක් උල්ලංඝණය වීම මගින් මිනිස් මනසට ප්‍රබල ලෙස බලපෑම් ඇති වෙයි. ඒවා කෙනෙකු විසින් කඩා බිඳ දැමීම අපරාධයක් ලෙස සැලකේ. ''අපරාධය යනු කුමක් දැයි විග්‍රහ කළ හැකි මාර්ග දෙකක් ඇත. ඉන් පළමුවැන්න නෛතික දෘෂ්ටි කෝණය ඔස්සේ අපරාධය දෙස බැලීම ය. දෙවැන්න සමාජයීය දෘෂ්ටිය ඔස්සේ අපරාධය යනු කවරේදැයි විග්‍රහ කිරීම ය.''[11]

අපරාධය පිළිබඳව විග්‍රහ කළ හැකි අංශ දෙක පිළිබඳව සහ ලෝකවජ්ජ සංකල්පය දෙස බලන විට බුදුසමය වඩාත් සමීප වන්නේ සමාජීය දෘෂ්ටිය ඔස්සේඅපරාධ විග්‍රහ කිරීමට ය. පුද්ගලයා කරනු ලබන වරද සඳහා නීති රීති පැනවූයේ පසුකාලීනව ය. සමාජය විසින් වරද ලෙස පිළිගත් පොදු සම්මතයන්ට හානි වන ක්‍රියා හඳුනාගෙන තිබිණි. සමාජය තුළ ඔවුන් පිළිගත් සාධු සම්මත ක්‍රියාවන්ට පටහැනි වන ලෙස යම් කෙනෙකු හෝ පිරිසක් විසින් කටයුතු කිරීම පොදුවේ වරදක් ලෙස සලකනු ලැබේ.



දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ විශ්වයේ ප්‍රභවය පිළිබඳවත් පුද්ගලයා විසින් කරනු ලබන වරද ආරම්භ වූ ආකාරයත් සඳහන් වේ. ලෝකයේ බොහෝ මානවීය ක්‍රියාදාමයන්හි ඇරඹුම විග්‍රහ කරනු ලබන මෙම සූත්‍රය ස්ත්‍රිය හා පුරුෂයා විසින් ඇති කරගත් ලිංගික සම්බන්ධතා හා ඒ පිළිබඳව සමාජය දැක්වූ ප්‍රතිචාර හෙළි කරයි. ''යම් තැනැත්තියක් පෙර ස්ත්‍රී වී සිටියා ද එම ස්ත්‍රියට ස්ත්‍රී ලිංගය පහළ විය. යම් කෙනෙක් පෙර පුරුෂව සිටියේ ද ඒ පුරුෂයාට ද පුරුෂ ලිංගය පහළ විය. ඒ කාලයේ ස්ත්‍රී තොමෝ ද බොහෝ වේලා පුරුෂයා දෙස බලයි. පුරුෂයා ද ස්ත්‍රිය දෙස බලයි. බොහෝ වේලා ඔවුනොවුන් බලන්නා වූ ඒ සත්ත්වයන්ට අධික රාගය පහළ විය. රාග පරිදාහ බැස ගත්තේ ය. ඒ සත්ත්වයෝ ඒ හේතුවෙන් මෛථුන්දම් සේවනය කළහ.''[12]

ස්ත්‍රී පුරුෂ සංවාසය ප්‍රජනන ක්‍රියාවලියේ අවශ්‍යම අංගයක් වුව එදා සමාජයට මෙය නුහුරු ක්‍රියාවකි. සමාජයේ සාධු සම්මත බිඳ දැමීමකි. එනිසා සමාජය එය රුචි කළේ නැත. එම හේතුව නිසා අපිරිසිදු තැනැත්තා නැසෙව ආදිය කියමින් මිනිසුන් ඔවුන්ට ගොම ගසා එළවා දැමූහ. සමාජය තුළ අසා නැති දැක නැති ක්‍රියාවක් සිදුවන විට එය අපරාධයක් ලෙස සලකා එය විරුද්ධව පොදු මිනිසා ක්‍රියාත්මක වූ ආකාරය මින් දැක්වේ.

අපරාධයක් යනු කුමක්දැයි විග්‍රහ කරගැනීම පිණිස ඉදිරිපත් වී ඇති නිර්වචන ද රාශියකි.

''මහජනයා ආරක්ෂා කිරීම සඳහා පොදු නීතියෙන් තහනම් කරන ලද ක්‍රියාවක් කිරීම කළ යුතු යැයි නියම කර ඇති හෝ ක්‍රියාවන් පැහැර හැරීම වරදකි.

අපරාධය රජය විසින් ස්ථාපිත කරන ලද අධිකරණ ක්‍රියා මාර්ගයකින් පවරන ලද දඬුවමකින් යුක්ත ය.

අපරාධය පොදු වරදකි. පුද්ගලයෙකුට කරනු ලබන පෞද්ගලික වරදක් හෝ සිවිල් වරදක් නො වන්නේ ය.''[13]

ක්‍රි.ව. 1960 වර්ෂයේ දී ටැපන් නැමැති නීතිවේදී සමාජ විද්‍යාඥයා ද අපරාධ පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළේ ය. ඔහු අපරාධය දෙස බැලුවේ නීතිමය දෘෂ්ටි කෝණයකිනි. ඔහුගේ අදහස අනුව,

A. අපරාධය යනු නීතිය උවමනාවෙන්ම උල්ලංඝණය කිරීමක් හෝ පැහැර හැරීමකි.

B. අපරාධයක් සිදු කිරීම අරභයා දැක්විය හැකි යුක්ති සහගත බවක් හෝ එම ක්‍රියාවට සාධාරණ හේතුවක් ඉදිරිපත් කළ හැකි නොවේ.

C. මේ අපරාධ සිදු කිරීම බරපතළ අපරාධයක් හෝ සුළු අපරාධයක් ලෙස රජය විසින් සලකනු ලැබේ.[14]

එලියට්ගේ විග්‍රහයට අනුව පෙනෙන්නේ ඔහුගේ අදහස් දැක්වීම ද නීති ක්ෂේත්‍රයට අනුකූල බව යි.

A. නීතියෙන් නොකළ යුතු යැයි සඳහන් කරන ලද ක්‍රියාවක් කිරීම හෝ නොසැලකිලිමත් ලෙස පැහැර හරිනු ලැබූ ක්‍රියාවක් වීම.

B. එබඳු වරදකට නීතියෙන් දඩයක් නියම කිරීම, හිරගෙට යැවීම. පිටුවහල් කිරීම, වාරණ, පරිවාස හෝ තවත් එවැනි දඬුවම් පැමිණවිය හැකි වීම.

C. ඒ දඬුවම් පමුණුවනු ලබන්නේ ඒ ඒ රාජ්‍ය ඒවායේ ස්වභාව තීරණය කර ඇති ආකාරයට ය.[15]

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අපරාධයක් හඳුනා ගැනීමට සහ එම වරද සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමට පිළිගත් නීති සම්මුතියක් හා නිශ්චිත අර්ථ නිරූපණයක් දකින්නට නැත. ''අපරාධ සහ අපරාධයක වගකීම වැනි වචන නීතියෙහි පුළුල් ලෙස භාවිත වෙතත් අපරාධය යන්නට පුළුල් අර්ථ නිරූපණයක් සැපයීම දුෂ්කර කාර්යයකි. ලංකා දණ්ඩ නීති සංග්‍රහය අපරාධ යන වචනය අර්ථ නිරූපණය නොකර යි.[16]



බුදුසමයෙහි අපරාධකරුවා හඳුන්වනු ලබන්නේ ආගුචාරී යන වචනයෙනි.[17] අපරාධකරුවකුගේ බාහිර ශරීර ලක්ෂණ පිළිබඳව ද ඇතැම් අපරාධ විද්‍යාඥයන්ගේ අවධානය යොමු වී තිබේ. ලොම්බොසො නැමැති අපරාධ විද්‍යාඥයා මේ පිළිබඳ දැඩි අවධානයට ලක් කළ කෙනෙකි. අපරාධකරුවකුගේ බාහිර ස්වරූපය පිළිබඳව ඔහු දක්වා ඇති කරුණු සැලකිල්ලට ගැනීම වැදගත් ය. එනම්,

1. හිස ප්‍රමාණයකට වඩා විශාල වීම, හිස්කබල පලල්ව පිහිටීම.
2. මුහුණ දෙපැත්තේ අසම්මිතික බවක් දක්නට ලැබීම.
3. හකු හා කම්මුල්වල පියවි ස්වභාවය ඉක්මවා තිබීම.
4. ඇසේ ආබාධ හා විශේෂතා බැලූ බැල්මට දිස් වීම.
5. කන්යුගල විශාල වීම, කුඩා වීම හෝ සතෙකුගේ මෙන් නෙරා තිබීම.
6. නාසය විරූපව පිහිටීම, උඩුකුරුව හැරී තිබීම. (සොරුන්ගේ නම් පැතලි වීම, මිනීමරුවන්ගේ නම් දිග වීම)
7. දෙතොල් මාංශ පේෂි මගින් පිරී ඉදිමී ඉදිරියට නෙරා තිබීම.
8. සතුන්ගේ මෙන් දෙකම්මුල දැඩිව වළගැසී තිබීම.
9. දිව මැදින් ඉරක් මෙන් දිව වළගැසී පිටතට නෙරා තිබීම.
10. දත්වල සාමාන්‍ය තත්ත්වයන් පැවතීම.
11. නිකට යටට නෙරා තිබීම හෝ එය විකෘතිව පැවතීම.
12. හිසකෙස් අධික ලෙස රැලි ගැසී පැවතීම.
13. බෙල්ලේ ඉතා අඩුවෙන් හෝ ඉතා වැඩියෙන් රැලි තිබීම.
14. අත් අධික වශයෙන් දිගට පිහිටා තිබීම.

15. පාදවල ඇඟිලි කෙටිව පිහිටා තිබීම.

16. මොළයේ කොටස් අතර සමතුලිත බවක් නොමැති වීම.[18]

බුදුසමයෙහි අපරාධ පිළිබඳව කරුණු ලබන අර්ථකථනය මෙයට වඩා වෙනස් වූවකි. පුද්ගලයාගේ බාහිර පරිසරයෙන් පමණක් ඔහු පිළිබඳව නිශ්චිත නිගමනයක් ලබා දිය නොහැකි වෙයි. සත්ත්වයා සංසාරය පුරා විවිධ හොඳ නරක අරගෙන එන නිසා ඒ අනුව ඔහුගේ උප්පත්තිය තීරණය වන බව හෙළි කරයි.[19] සංසාරගත ස්වභාවයන්ගෙන් හා පුණ්‍ය පාප යන තත්ත්වයන් බලපායි. බුදුසමය අනුව කෙනෙකුගේ අපරාධකාරී චර්යාව සකස් වීම සඳහා බාහිර පරිසරය පමණක් එක ම සාධකය ලෙස නොපිළිගනියි. පවිටු මිතුරු ඇසුර (අජාසත්ත සිද්ධිය) සංසාරයේ ගෙන එන පින් පව් බලයෙන් ජීවත් වන පරිසරයෙන් ද (පතිරූප දේස වාසෝච) ලබන විවිධ ප්‍රේරණ පුද්ගලයා යහපතට හෝ අයහපතට යොමු කෙරේ.

ලෝකවජ්ජ ලෙස බුදුසමය දක්වනු ලබන්නේ භෞතික අපරාධ පමණක් නොවේ. සිත, කය, වචනය යන තිදොරින්ම සිදු වන වැරදි අපරාධ ලෙස සලකා තිබේ. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයට අනුව පුද්ගලයා කරන ක්‍රියාවට චේතනාවේ බලපෑම පිළිබඳව සොයා බැලුව ද සිතින් පමණක් කරන අපරාධ පිළිබඳව අවධානය ලක් කරන්නේ නැත. එහිදී අවධානය යොමු කරන්නේ කය සහ වචනය යන අංශ පිළිබඳව හා එම ක්‍රියාව සඳහා බලපෑ චේතනාව පිළිබඳවයි. බුදුසමයෙහිදී සිතින් පමණක් කළ හැකි අපරාධ පිළිබඳව ද දක්වයි. ඒවා ලෝකවජ්ජ ලෙස දක්වා තිබේ. එබඳු ක්‍රියාවක් අපරාධයක් බවට පත් වීම සඳහා සචිත්තක පක්ෂයේ දශ අකුශල කර්ම පථ විය යුතු බව දක්වා තිබේ. සචිත්තක යනු සැලසුම් සහගත චේතනාව ලෙස දැක්වීම වඩාත් උචිත ය. චේතනාව සහ ක්‍රියාව අතර එබඳු සැලසුම් සහගත බවක් පැවතිය යුතු වෙයි.

බුදුසමයෙහි ලෝකවජ්ජ යනුවෙන් හඳුන්වන සාවද්‍ය ක්‍රියාව පුද්ගලයා විසින් ම සැලසුම් සහගතව කරන ක්‍රියාවක් බව පෙනේ. අපරාධයක් සාවද්‍ය ක්‍රියාව හා සාවද්‍ය චේතනාව යන



16 OCT 2017

දෙවැදෑරුම් අංගයන්ගෙන් සමන්විත විය යුතු ය.[20] සාවද්‍ය ක්‍රියාව පිළිබඳව නීතිමය අර්ථකථනයේ දී එය අංග තුනකින් සමන්විත වන බව දක්වා තිබේ. එනම්, (අ) නීතියෙහි සඳහන් වන විශේෂ සාධක සමූහයක්, (ඇ) එම සාධක සමූහය තුළ හැසිරීමෙහි ප්‍රතිඵලයක් (සම්පාදකයෙකු) යනුවෙනි. ක්‍රියාවක දී එම ක්‍රියාව සාවද්‍ය වූවක් බව දැක්වීමට සම්පූර්ණ විය යුතු අංග කිපයක් කංඛාවිතරණී අටුවාවේ දැක්වේ.[21]

සාවද්‍ය ක්‍රියාව පිළිබඳව නීතිය පිළිගත් අර්ථකථනය දහමෙහි උගන්වන ක්‍රමයට වඩා තරමක් වෙනස් ය. එයට හේතුව වන්නේ බුදුසමයේ යම් සාවද්‍ය ක්‍රියාවක් පිළිබඳව බැලීමේ දී ඕනෑම අවස්තාවක එකම විදියට බැලීමක් නීතියෙහි එම ක්‍රමය වෙනස් වීමක් ය.[22] "අපරාධ නීති භාවිතයේ දී එකම හැසිරීම විටෙක නීතියෙන් තහනම් වෙයි. නිදසුනක් ලෙස බල සහිත උසාවියක් මගින් පනවන ලද මරණීය දණ්ඩන නියෝගයක් ක්‍රියාත්මක කරන්නකුගේ හැසිරීම සෙසු මිනීමරුවන්ගේ හැසිරීමට වඩා වෙනස් නොවේ. නමුත්, නීතිය මගින් නියෝග කර ඇති නිසා එම හැසිරීමේ ප්‍රතිඵලය සාපරාධී නොවේ." සාවද්‍ය ක්‍රියාව වශයෙන් නිතිය අදහස් කරනු ලබන්නේ ක්‍රියාවක් නොව ක්‍රියාත්මක ප්‍රතිඵලය යයි.[23] නමුත් බුදුසමයෙහි එසේ නොවේ.

බුදුසමයෙහි ලෝකවජ්ජ ලෙස හඳුන්වනු ලබන්නේ සචේතනික වූ දශ අකුශල කර්මපථයන් ය.[24] පුද්ගලයා කරන සාවද්‍ය ක්‍රියාවෙන් පුද්ගලයාට ද පොදු සමාජයට ද පැමිණෙන්නේ අයහපතක් ය. එය තමාගේ මෙන්ම සමස්ත සමාජයේ අහිත පිණිස පවතියි. සමාජයේ අන්‍යයන් විෂයයෙහි මෛත්‍රීචින්තනය පතුරුවා හැරිය යුතු වෙයි.[25] සමාජයේ පොදු පිරිසට හානිකර ක්‍රියාවක් කිසිවෙකු විසිනුදු නොකළ යුතු බව බුදුසමයෙන් අවධාරණය කොට ඇත.

"සුගතියට හෝ දුගතියට මිනිසා යොමු කිරීමට හැකි කුශල හෝ අකුශල කර්ම මාර්ග දහයඃ දශවිධ කුශල කර්ම පථ හා දශවිධ අකුශල කර්මපථ නම් වේ. ඒවා නම්, පාණාතිපාතා, අදින්නාදානා, කාම මිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාච, පරුෂාවාච,

57478

සමුප්‍රප්පලාප, අභිජ්ඣා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන දහය වේ.[26] මෙම අකුසල කර්ම බුදුසමයේ ලෝකවජ්ජ ලෙස දක්වා තිබේ.[27]

### පාණඝාතය හා සමාජ අපරාධ

පාණාතිපාත අකුසල කර්මය කෝෂ ග්‍රන්ථවල හඳුන්වා ඇත්තේ "සත්ත්වයකුගේ පණ නැති කිරීමෙන් සිදුවන අකුසල කර්මය හෙවත් පරපණ නැසීම නිසා ඇතිවන පාපය"[28] යනුවෙනි. රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් එය "සත්ත්වයකුගේ ජීවිතය පැවතිය යුතු තරම් කල් පවතින්නට නොදී යම්කිසි උපක්‍රමයකින් අතරකදී විනාශ කර දැමීම පාණාතිපාත නම් වේ. පාණඝාතය යනු එයට නමකි"[29] යනුවෙන් දක්වා තිබේ.

උපත ලබන සෑම සත්ත්වයකුගේ ම අභිපාය වන්නේ ජීවත් වීම ය. එයට හානි පැමිණවීම සුදුසු නො වන අතර එය බරපතළ වරදක් ලෙස බුදුසමය දකී. පාණවධ අතහැර, පාණඝාතයෙන් වැළකී, බහා තබන ලද දඬුමුගුරු සහිත ව, බහා තබන ලද අවි ආයුධ ඇති ව පාපයෙහි ලජ්ජාවී කරුණාවෙන් යුතු ව සියලු පාණීන් කෙරෙහි හිත අනුකම්පාවෙන් ජීවත් විය යුතු බව බුදුසමය දක්වයි.[30] සත්ත්ව ඝාතනය ද හිංසනය ද දෙකින් ම බැහැර වූ මිනිසා සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාව දැක්විය යුතුය. පාණ ඝාතයෙහි ලජ්ජා විය යුතු ය යනුවෙන් විරමනය මෙන්ම සමාදානය ද උගන්වා තිබේ. මින් දක්වන්නේ සත්ත්ව ඝාතනය ප්‍රබල අකුසල කර්මයක් වන බවයි. සත්ත්වයන් ඝාතනය කිරීම අඩු වයසින් මිය යාමට ද සත්ත්ව හිංසනය නිතර ලෙඩ රෝගවලට භාජනය වීමට ද හේතු වේ.[31]

අකුසල කර්මපථයක් වීම සඳහා අකුසල ක්‍රියාව අංග පහකින් සමන්විත යුතු වෙයි. ශික්ෂාපදයක් කැඩීමේ දී ඇවතක් සිදුවීමට නම් ඒ සඳහා අවශ්‍ය අංග සම්පූර්ණ විය යුතුය.[32] පුද්ගලයා විසින්

57478

16 OCT 2017



## ආන්තික සටහන්

1. චන්දවිමල හිමි, රේරුකානේ, බෞද්ධයාගේ අත්පොත, පිටඃ 52.
2. සිවිල් නඩු විධාන සංග්‍රහය.
3. අපරාධ නඩු විධාන සංග්‍රහය.
4. පෙරේරා, මහාචාර්ය ඥානදාස, අපරාධ මනෝවිද්‍යාව සහ වින්දිත උපදේශනය, පිටඃ 81.
5. නන්දසේන, මහාචාර්ය රත්නපාල, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 15.
6. පෙරේරා, මහාචාර්ය ඥානදාස, අපරාධ පිළිබඳ දාර්ශනික විමසුමක්, පිටඃ 45.
7. බෞද්ධ විශ්ව කෝෂය, 1, පිටඃ 470.
8. රත්නපාල, මහාචාර්ය නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 21.
9. එම, පිටඃ 11.
10. බෞද්ධ විශ්ව කෝෂය 1, පිටඃ 470.
11. රත්නපාල, මහාචාර්ය නන්දසේ, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 09.
12. දී. නි. 3, පිටඃ 136, අග්ගඤ්ඤ සූත්තං.
13. රත්නපාල, මහාචාර්ය නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 13.
14. රත්නපාල, මහාචාර්ය නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 14.
15. රත්නපාල, මහාචාර්ය නන්දසේන, අපරාධ විද්‍යාවේ මූලධර්ම, පිටඃ 15.
16. පීරිස්, මහාචාර්ය ජී. එල්. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය, අපරාධයක සම්පාදක ධාතු, පිටඃ 07.
17. අං. නි. (1), පිටඃ 96, වජ්ජ සූත්තං.
18. පෙරේරා, මහාචාර්ය ඥානදාස, අපරාධ මනෝවිද්‍යාව සහ වින්දිත උපදේශනය, පිටඃ 24.
19. ම. නි. පිටඃ 332, චූළකම්ම විභංග සූත්තං.
20. පීරිස්, මහාචාර්ය ජී. එල්. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය, අපරාධයක සම්පාදක ධාතු, පිටඃ 09.
21. කංඛාවිතරණී නාම මාතිකාට්ඨකථා, පිටඃ 21.
22. පීරිස්, මහාචාර්ය ජී. එල්. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය, අපරාධයක සම්පාදක ධාතු, පිටඃ 10.

23. පීරිස්, මහාචාර්ය ජී. එල්. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය, අපරාධයක සම්පාදක ධාතු, පිටඃ 10.

24. සමන්තපාසාදිකානාම විනයට්ඨකථා 1, පිටඃ 194.

25. ඛු. නි. 1, (ඛු, පා), පිටඃ 20 මෙත්ත සූත්තං.

26. බෞද්ධ ශබ්ද කෝෂය, 1, පිටඃ 658.

27. සමන්තපාසාදිකානාම විනයට්ඨකථා 1, පිටඃ 159.

28. බෞද්ධ ශබ්ද කෝෂය, 11, පිටඃ 1084.

29. චන්දවිමල හිමි, රේරුකානේ, බෞද්ධයාගේ අත්පොත, පිටඃ 49.

30. ම. නි. 3, පිටඃ 20, දේවදහ සූත්තං.

31. ම. නි. 3, පිටඃ 332, චූළකම්ම විභංග සූත්තං.

32. රේවත හිමි, ඇස්වත්තේ, වහලය ගලවන්න, පිටඃ 111.